ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/7/1/3 | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.03.25 |

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 02/2022**

දකුණු පළාත් සභාවේ සියලුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් සහ
ගණන් දීමේ නිලධාරීන් වෙත.

**දකුණු පළාත් සභාවේ රාජ්‍ය නිලධාරීන් වෙත උත්සව අත්තිකාරම් ගෙවීම - 2022**

ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 13 වගන්තිය ප්‍රකාර දකුණු පළාත් සභා සේවයේ නියුතු සියලුම රාජ්‍ය නිලධාරීන් සඳහා 2022 වර්ෂය වෙනුවෙන් රුපියල් දස දහස (10,000.00) ක උත්සව අත්තිකාරම් මුදලක් ලබා දීමට දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් තීරණය කර ඇත.

02. ඒ අනුව, ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 13.1 වගන්තිය ප්‍රකාර සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් මෙම අත්තිකාරම් මුදල ලබා ගැනීමට හිමිකම් ලබන අතර, පසු ගිය වසර සඳහා උත්සව අත්තිකාරම් මුදල් ලැබ මේ වන විට ගෙවා අවසන් කර ඇති නිලධාරීන් සඳහා ද මෙම අත්තිකාරම් මුදල ගෙවීමට හැකි ය. ලබා ගන්නා අත්තිකාරම් මුදල සමාන වාරික දහයකින් (10) නිලධරයා ගේ මාසික වැටුපෙන් අය කර ගත යුතු ය.

03. මෙම අත්තිකාරම් මුදල පොලී රහිත අත්තිකාරමක් වන අතර, මේ සඳහා ඇපකරුවන් අවශ්‍ය නොවේ.

04. එමෙන්ම මෙම අත්තිකාරම් මුදල සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 13 වගන්තිය යටතේ වන අනෙකුත් නියමයන් එලෙසින් ම බල පැවැත්වේ.

ආර්.සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත් : 1. සහකාර විගණකාධිපති, විගණන දෙපාර්තමේන්තුව, ගාල්ල. - දැ.ගැ.පි.
2. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත. - දැ.ගැ.පි.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
"සෞභාග්‍යමත් දකුණු පළාතක්"